**ශීර්ෂය 303 - පේෂකර්මාන්ත දෙපාර්තමේන්තුව පිළිබඳ විගණකාධිපති වාර්තාව - 2017 වර්ෂය**

---

2017 අංක 32 දරන විසර්ජන (සංශෝධන) පනතින් සංශෝධිත 2016 අංක 24 දරන විසර්ජන පනතේ පළමුවන උපලේඛනයේ හා තෙවන උපලේඛනයේ සඳහන් ශීර්ෂය හා විෂය අංකය යටතේ වන විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශය පේෂකර්මාන්ත දෙපාර්තමේන්තුව විසින් විගණනයට ඉදිරිපත් කරන ලදී. එම ගිණුමෙන් හා සැසඳුම් ප්‍රකාශයෙන් නිරූපනය වන මූල්‍ය හා භෞතික කාර්යසාධනය ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව ප්‍රකාරව විගණනය කරන ලදී.

**1.2 ප්‍රධාන ගණන්දීමේ නිලධාරීන් හා ගණන්දීමේ නිලධාරීගේ මූල්‍ය කළමනාකරණය හා ගිණුම් කටයුතුභාවය පිළිබඳ වගකීම**

---

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ මුදල් රෙගුලාසි 124 ප්‍රකාරව රාජ්‍ය මුදල් ඉපැයීම සහ රජයට ලැබිය යුතු මුදල් එකතු කිරීම මෙන්ම රජයේ සියළුම මුදල් කටයුතු අධීක්ෂණය පිළිබඳ පොදු ආවේක්ෂණයද මුදල් අමාත්‍යවරයා වෙත පැවරී ඇත. මුදල් අමාත්‍යවරයා විසින් එම වගකීම ඉටු කිරීම පිණිස මුදල් රෙගුලාසි 124(2) ප්‍රකාරව ප්‍රධාන ගණන්දීමේ නිලධාරීන් පත් කර ඇත. මුදල් රෙගුලාසි 125(1) (අ) ප්‍රකාරව දෙපාර්තමේන්තු ප්‍රධානියා තම දෙපාර්තමේන්තුවේ සියළු මුදල් ගනුදෙනු පිළිබඳව ගණන්දීමේ නිලධාරියා වන අතර ආදායම් ගණන්දීමේ නිලධාරියා භාණ්ඩාගාරය විසින් පත්කර ඇත. පාර්ලිමේන්තුව විසින් පනවන ලද සීමාවන් ඇතුළත තම කාර්යභාරයන් ඉටු කර ඉදිරිපත් කරනු ලබන ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148, 149, 150 හා 152 ව්‍යවස්ථාවන්, වෙනත් ව්‍යවස්ථාපිත විධිවිධානයන්, රජයේ මුදල් රෙගුලාසි හා පරිපාලන රෙගුලාසිවලට අනුකූලව පවත්වා ගෙන යාම, පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන අභ්‍යන්තර පාලනයන් සැලසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම හා පවත්වා ගෙන යාමත් මෙම වගකීමට ඇතුළත් වේ.

**1.3 විගණන විෂය පථය**

---

ශීර්ෂය 303 - පේෂකර්මාන්ත දෙපාර්තමේන්තුවේ 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය හා භෞතික කාර්යසාධනය සම්බන්ධයෙන් සැලැසුම් කිරීම, රාජ්‍ය වියදම්, රාජ්‍ය ආදායම්, මානව හා භෞතික සම්පත් කළමනාකරණය, අභ්‍යන්තර පාලන විධිවිධාන යොදා ගැනීම, නීති,රීති හා රෙගුලාසිවලට අනුකූලවීම හා පොත්පත්, ලේඛන, වාර්තා හා සැසඳුම් ප්‍රකාශන යාවත්කාලීන කර පවත්වා ගැනීම, ගිණුම් පිළියෙල කර කාලීනව ඉදිරිපත් කිරීම, කාර්යසාධන දර්ශක පදනම් කරගෙන අදාළ පාර්ශවයන් වෙත කාර්යසාධන වාර්තා නිකුත් කිරීම පිළිබඳව ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන යටතේ විගණනය කරන ලදී. සමාලෝචිත වර්ෂය සඳහා වූ කළමනාකරණ විගණන වාර්තාව 2018 ඔක්තෝබර් 19 දින දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂවරයා වෙත නිකුත් කරන ලදී. ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ විගණන නිරීක්ෂණ, අදහස් දැක්වීම් සහ සොයා ගැනීම්, විගණනය සඳහා ඉදිරිපත් කරන ලද සැලසුම්, ගිණුම්, සැසඳුම් ප්‍රකාශන හා කාර්යසාධන වාර්තා පිළිබඳ සමාලෝචනය සහ ගනුදෙනුවල නියැදි පිළිබඳ තහවුරු පරීක්ෂා කිරීම් මත පදනම් වී ඇත. එම සමාලෝචනය හා පරීක්ෂණයන්ගේ විෂය පථය සහ ප්‍රමාණය, මට ලැබී ඇති කාර්ය මණ්ඩලය, අනෙකුත් සම්පත් හා කාලවේලා යන සීමාවන් ඇතුළත හැකිතාක් පුළුල් විගණනයක් කළ හැකි වන පරිදි පිළියෙල කරන ලද්දකි.

## 1.4 විගණන නිරීක්ෂණය

2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා පේෂකර්මාන්ත දෙපාර්තමේන්තුවේ සිදු කරන ලද විගණනයේදී අනාවරණය වූ විගණන නිරීක්ෂණ ඉහත 1.3 ඡේදයේ සඳහන් කර ඇති කළමනාකරණ විගණන වාර්තාවේ විස්තරාත්මකව දක්වා ඇත. එම නිරීක්ෂණවලින් ප්‍රමාණාත්මක හා වැදගත් විගණන නිරීක්ෂණ මෙම වාර්තාවේ 2.1 ඡේදයේ සිට 2.10 දක්වා ඡේදවල සඳහන් කර ඇත. මූල්‍ය පරිපාලනයේ ප්‍රමාණවත් බව තහවුරු වන පරිදි ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ මුදල් රෙගුලාසි 128 හි සඳහන් විධිවිධාන ඉටුකිරීමේදී අනාවරණය වූ පහත සඳහන් සටහනේ සාරාංශගත කර දක්වා ඇති විගණන නිරීක්ෂණවලට යටත්ව ප්‍රධාන ගණන්දීමේ නිලධාරී හා ගණන්දීමේ නිලධාරී වශයෙන් තම ගිණුම්කටයුතුභාවය සතුටුදායක ලෙස ඉටුකර තිබෙන බව නිරීක්ෂණය විය.

| **මුදල් රෙගුලාසි 128(1)- ගණන්දීමේ නිලධාරීගේ ගිණුම් කටයුතුභාවය** | | **ගණන්දීමේ නිලධාරිගේ එම විධිවිධානයට අනුගත වී නොතිබීම** | **නිරීක්ෂණය ඇතුළත් වාර්තාවේ ඡේද යොමුව** |
|---|---|---|---|
| මුදල් රෙගුලාසි 128(1)(අ) | රජය විසින් නියමකර දක්වා ඇති ප්‍රතිපත්තිය හා බලය දෙනු ලැබූ කටයුතු සඳහා මූල්‍ය ප්‍රතිපාදන සලසා දීමෙහිලා පාර්ලිමේන්තුවේ අභියෝගයන් ගැන සැලැකිල්ලට ගෙන තම දෙපාර්තමේන්තුවේ කටයුතු විචක්ෂණ භාවයෙන් යුක්තව සැලැසුම් කර ක්‍රියාත්මක කරන බව සහ ප්‍රස්තුත වර්ෂය සඳහා නියමිත වැඩසටහන සම්පූර්ණ කිරීමට සහ/හෝ නියමිත ඉලක්කය සාක්ෂාත් කර ගැනිමට පරිශ්‍රමයක් දක්වා තිබිම | 1. ප්‍රසම්පාදන කටයුතු සැලැසුම් නොකිරිම/ ප්‍රමාණවත් පරිදි සැලැසුම් නොකිරිම<br>2. අනාර්ථික ගනුදෙනු | 2.2.1<br>2.4 |
| 128(1)(ආ) | තම දෙපාර්තමේන්තුවේ මූල්‍ය පාලනය හා ගිණුම්කරණය සඳහා සංවිධානය සාර්ථක බවට සහ අවශ්‍ය අවස්ථාවලදී රජයට ලැබිය යුතු ගාස්තු නිවැරදිව නිශ්වය කිරීමට ඒවා ක්‍රමානුකූලව ද සම්පූර්ණයෙන්ම ද අප්‍රමාදව ද එකතු කර ගැනිමට සහ ලැබෙන මුදල් ගිණුම්ගත කිරීමටද, රජය වෙනුවෙන් වගකීම්වලට බැඳීම් සඳහා බලය දීමටද ඉටුකරන ලද සේවාවන් සැපයිම් අධීක්ෂණය හා පරීක්ෂා කිරිමට සහ එම රජයේ අරමුදලින් ඒ සඳහා අප්‍රමාදව හා නිවැරදිව ගෙවීම් කිරීමට ඉන් ප්‍රමාණවත් තරම් විධිවිධාන සලසා තිබිම. | ප්‍රසම්පාදන ක්‍රියාවලිය ක්‍රියාත්මක කිරීමේ අඩුපාඩු | 2.2.2 |
| 128(1)(ඉ) | රජය සතු වූ හෝ රජයේ භාරයේ පවත්නා මුදල් බඩුබාහිර උපකරණ හා වෙනත් වත්කම් සුරක්ෂිතව තබා ගැනීම සහ සංරක්ෂණය සඳහා ප්‍රමාණවත් තරම් සහ විධිමත් විධිවිධාන යොදවනු ලබන බව, ඒවා වරින්වර සත්‍යාක්ෂණය කරනු ලබන බවටත්, ඒවා නිසියාකාරව නිෂ්කාශණය | වත්කම් කළමනාකරණයේ අඩුපාඩු | 2.3 |

| | | | |
|---|---|---|---|
| | කරනු ලබන කල්හි එසේ නිෂ්කාශණය කිරීම නියමිත රෙගුලාසිවලට හා උපදෙස්වලට අනුකූලව කරනු ලබන බව | | |
| 128(1)(ඊ) | ප්‍රධාන ගණන්දීමේ නිලධාරියා හෝ භාණ්ඩාගාරය හෝ විසින් ඉල්ලා සිටින තොරතුරු, ප්‍රකාශ හා වාර්තා නිවැරදිව කලට වේලාවට ඉදිරිපත් කරන බව | වාර්ෂික කාර්යසාධන වාර්තාව ප්‍රමාද වී ඉදිරිපත් කිරීම | 2.1.2 |
| 128(1)(ඌ) | හිඟව තිබෙන ගාස්තු යනාදිය අයකර ගැනිමට විශේෂ විධිවිධාන යොදන බවට සහ එම කාර්ය පැවරී ඇති නිලධාරීන් විසින් හිඟ මුදල් පිළිබඳව ඒවා අයකර ගැනීම කඩිනම් කිරීමට ගනු ලැබූ පියවර පිළිබඳව යටත් පිරිසෙන් තුන් මාසයකට වරක් හෝ අන්‍යාකාරයකින් විධානය කළ පරිදි හෝ තමා වෙත වාරතා කරන බව, | රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුමේ හිඟහිටි ණය ශේෂ අයකර ගැනීම | 2.7 |
| 128(1)(එ) | රජයේ කටයුතු ඉටු කිරීමේදී අපේක්ෂිත අරපිරිමැස්ම, කාර්යක්ෂමතාව, විධිමත්බව හා අවංකභාවය යන කරුණු පිළිබඳ නිසි සැලැකිල්ලෙන් යුක්තව තම දෙපාර්තමේන්තුවේ කටයුතු කරගෙන යන බව | කළමනාකරන දුර්වලතා | 2.5 |
| 128(1)(ක) | ගණන්දීමේ නිලධාරියා වශයෙන් තමා වගකීමට බැඳි සිටින වියදම් ශීර්ෂයක එක් එක් වැඩසටහන වෙනුවෙන් මුදල් වර්ෂය අවසානයේදී විසර්ජන ගිණුමක් ප්‍රධාන ගණන්දීමේ නිලධාරී වෙත ඉදිරිපත් කරනු ලබන බව (මු.රෙ.150 බලන්න) | විසර්ජන ගිණුමේ සඳහන් අඩුපාඩු | 2.6 (අ) i |

## 2. ප්‍රමාණාත්මක හා වැදගත් විගණන නිරීක්ෂණ

### 2.1 කාර්යසාධනය

#### 2.1.1 කාර්යභාරයන් ඉටු නොකිරීම

**ක්‍රියාකාරී සැලැස්මේ ඇතුළත් කාර්යභාරයන් ඉටු නොකිරීම**

ක්‍රියාකාරී සැලැස්මට අනුව අත්යන්ත්‍ර ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම හා ස්වභාවික වර්ණ පිළිබඳ ග්‍රන්ථයක් ප්‍රකාශයට පත් කිරීම සැලසුම් කර තිබුණද එය සිදුකර නොතිබුණි. මේ නිසා වාර්ෂික අයවැය ඇස්තමේන්තුවෙන් සලසා තිබුණු රු. මිලියන 3.95 ක ප්‍රතිඵල නිෂ්ඵල වී තිබුණි.

#### 2.1.2 වාර්ෂික කාර්යසාධන වාර්තාව

2002 සැප්තැම්බර් 12 දිනැති අංක 402 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාරව පේෂකර්මාන්ත දෙපාර්තමේන්තුව විසින් මුදල් වර්ෂය අවසාන වී දින 150 ක් ඇතුළත සමාලෝචිත වර්ෂයට අදාළ කාර්යසාධන වාර්තාව පාර්ලිමේන්තුවේ සභාගත කළ යුතු වුවත්, එම වාර්තාව 2018 සැප්තැම්බර් වන

විටත් පාර්ලිමේන්තුවේ සභාගත කර නොතිබුණි.

## 2.2 ප්‍රසම්පාදන ක්‍රියාවලිය මගින් සැපයුම් හා සේවා ලබා ගැනීම

### 2.2.1 ප්‍රසම්පාදන සැලැස්ම

සවිස්තරාත්මක ප්‍රසම්පාදන සැලැස්මක් පිළියෙල කර නොතිබුණු අතර ප්‍රධාන ප්‍රසම්පාදන සැලැස්ම මාස 06 කට වැඩි නොවන කාලයක් තුලදී නිතිපතා යාවත්කාලීන කළ යුතු වුවද, සමාලෝචිත වර්ෂයට අදාල ප්‍රසම්පාදන සැලැස්ම සංශෝධනය කර තිබුණේ 2017 දෙසැම්බර් 22 දිනදීය.

### 2.2.2 ප්‍රසම්පාදන ක්‍රියාවලිය ක්‍රියාත්මක කිරීම

දෙපාර්තමේන්තුව විසින් කිරම පේෂ පාසල, සමන්තුරේ පේෂ පාසල, හක්මන පේෂ පාසල, කටුබැද්ද පුහුණු මධ්‍යස්ථානය නවීකරණය කිරීම සහ අත්යන්ත්‍ර උපකරණ හා අනෙකුත් ද්‍රව්‍ය මිලදී ගැනීම සඳහා රු.මිලියන 34.72 ක්ද වැය කර තිබුණි. මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ. .

(අ) රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 8.12.2 හා 8.13.4 මාර්ගෝපදේශ ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. .

(ආ) ගිවිසුමේ 8 (අ) උප වගන්තිය ප්‍රකාරව ප්‍රමාණුකූලව නිශ්චය කෙරුනු හෝ නැතහොත් ඒ සඳහා අධ්‍යක්ෂ විසින් බලය පවරන ලද කාර්මික නිලධාරී විසින් නිකුත් කරන ලද සහතිකයක් මත ඇස්තමේන්තු අගයෙන් සියයට 50 ඉක්මවා ඉටු කරන ලද වැඩ කටයුතුවල දළ වටිනාකමින් සියයට 75 ක් ගෙවිය හැකි වුවත් ඊට පටහැනිව නවීකරණ අවස්ථා 3 දී කටයුතු කර තිබුණි.

(ඇ) හක්මන පේෂ පාසල නවීකරණයට අවම මිල ඉදිරිපත් කල ලංසුකරු එක් අයිතමයක් සඳහා ඉදිරිපත්කර තිබූ ඒකක මිල පිළිගත නොහැකි බව දන්වමි. අවම මිල ඉදිරිපත් කර තිබූ ලංසුව ප්‍රතික්ෂේප කර රු. මිලියන 0.22 ක් වැඩි වටිනාකමක් ඇති ලංසුකරුට කොන්ත්‍රාත්තුව පිරිනමා තිබුණි.

(ඈ) කිරම පේෂ පාසල නවීකරණයට අදාලව ඇස්තමේන්තුවේ සඳහන් වර්ග අඩි 11.15 ක් හා පිරිවැය රු. මිලියන 0.29 ක් වූ අයිතමය කොන්ත්‍රාත්කරු විසින් සිදු කර නොතිබුණි.

(ඉ) 2017 දෙසැම්බර් 20 දිනට සැපයිය යුතු බවට දන්වා තිබූ අත්යන්ත්‍ර 145 ක් 2017 දෙසැම්බර් 31 දින වන විටත් ලැබී නොතිබුණු අතර අත්යන්ත්‍ර 215 ක් හා වයින්ඩින් යන්ත්‍ර 418 ක් ඉතිරි වී තිබුණි.

## 2.3 වත්කම් කළමනාකරණය

දෙපාර්තමේන්තුවේ වත්කම් සම්බන්ධයෙන් සිදු කළ නියැදි විගණන පරීක්ෂාවේදී පහත සඳහන් අඩුපාඩු නිරීක්ෂණය විය.

(අ) **වාහන උපයෝජනය**

දෙපාර්තමේන්තුව විසින් මෙහෙයුම් කල්බදු ක්‍රමය යටතේ වාහන 02 ක් 2017 මාර්තු 08 දින ලබා ගෙන තිබූ අතර සමාලෝචිත වර්ෂය තුල කාර් රථය සඳහා රු.මිලියන 1.62 ක්ද, ඩබල් කැබ් රථය සඳහා රු. මිලියන 2.21 ක්ද වාර්ෂික කුලිය ලෙස ගෙවා තිබුණි. වර්ෂයේ මාස 10 තුල කාර් රථය කිලෝමීටර 13,429 ක්ද, ඩබල් කැබ් රථය කිලෝමීටර 29,108 ක්ද ධාවනය

කර තිබුණි. අවම වශයෙන් මසකට කිලෝමීටර 3500 ක් ධාවනය කල යුතු වුවත් පිළිවෙලින් කිලෝමීටර 1342 ක් හා 2910 ක් ධාවනය කර තිබුණි.

(ආ) **වත්කම්වලින් රජයට ලැබිය යුතු ආදායම නොලැබීම**

-----------------------------------------------------------

දෙපාර්තමේන්තුව විසින් පෞද්ගලික අංශයට දිගුකාලීන බදු පදනම මත ලබා දී තිබුණු බලවේග පේෂකර්මාන්ත ව්‍යාපාර වලින් අයවිය යුතු රු.මිලියන 15.46 ක් වූ බදු මුදල් හා අමතර කොටස්වල වටිනාකම අයකර ගැනීමට සමාලෝචිත වර්ෂය අවසාන විටත් නොහැකි වී තිබුණි.

## 2.4 ආර්ථික නොවන ගනුදෙනු

---------------------------

ජාතික අත්යන්ත්‍ර රෙදිපිළි ප්‍රදර්ශන සම්මාන උළෙල සමන්තුරේ පැවැත්වීමට රු. මිලියන 0.52 ක් නගරශාලා වෙන් කර ගැනීම් ගාස්තු හා පුවත්පත් දැන්වීම් ගාස්තු සඳහා දරා තිබුණද අදාල සම්මාන උළෙල නොපැවැත්වීම නිසා එම මුදල අනාර්ථික වියදමක් වී තිබුණි.

## 2.5 කළමනාකරණ දුර්වලතා

-------------------------

නියැදි විගණන පරීක්ෂණවලදී පහත සඳහන් දුර්වලතා නිරීක්ෂණය විය.

(අ) වර්ෂ 05 කට වරක් සියයට 150 කින් බදු කුලී සංශෝධනය කළ යුතු වුවත් දෙපාර්තමේන්තුව විසින් කලින් කලට බදු කුලී සමාලෝචනය වන බව ගිවිසුම්වල දක්වා තිබුණි. එසේ වුවද ප්‍රථම වරට 2016 දී බලවේග වැඩබිම් 04 ක පමණක් බදු කුලී සමාලෝචනය කර තිබුණි.

(ආ) දෙපාර්තමේන්තුව විසින් බදු දුන් පේෂකර්ම බලවේග ව්‍යාපාර වලින් බදු මුදල් ලැබීම් සම්බන්ධ ලේඛනයක් නඩත්තු කර නොතිබුණි.

(ඇ) ජාතික අත්යන්ත්‍ර රෙදිපිළි ප්‍රදර්ශනයට සමගාමීව 2017 දෙසැම්බර් 15 දින පැය එකහමාරක කාලයක් තුල පවත්වන ලද මංගල සාරි විලාසිතා දැක්ම සඳහා රු. මිලියන 2.40 ක් වැය කර තිබුණි. මෙම වියදම පේෂ පාසැල් හා මෝස්තර පුහුණු පාසල් වල වර්ෂයේ සඳහා වියදමෙන් සියයට 37 ක් විය.

(ඈ) අමාත්‍යාංශයේ ප්‍රතිපාදන වලින් මරදමුණ පේෂකර්මාන්ත ව්‍යාපෘතිය හා අම්පාර දිස්ත්‍රික් අත්යන්ත්‍ර පේෂකර්මාන්ත ව්‍යාපෘතිය සඳහා අත්යන්ත්‍ර 147 ක් හා වයින්ඩින් යන්ත්‍ර 122 ක් ගබඩාවෙන් නිකුත් කර තිබුණි. එම යන්ත්‍ර ප්‍රාදේශීය ලේකම් වරු මාර්ගයෙන් ලබා ගන්නා ලද ප්‍රතිලාභින්ටම ලබාදුන් බවට තොරතුරු ඉදිරිපත් නොවුණි. ලබාදුන් ප්‍රතිලාභින් සමගින් ගිවිසුමකට එළඹී නොතිබූ අතර පසු විපරම් කටයුතු සිදුකර නොතිබුණි.

(ඉ) ආයතනයේ අරමුණු ඉටු කර ගැනීම සඳහා ඉටු කළ යුතු අත්යන්ත්‍ර පේෂකර්මාන්තය සංවර්ධනය සඳහා අදාල ප්‍රතිපත්ති සකස් කිරීම, විදේශීය අලෙවි කටයුතු සංවිධානය කිරීම, පේෂකර්මාන්ත ක්ෂේත්‍රයට නව තාක්ෂණය හඳුන්වා දීම සහ අදාල සංවර්ධන කටයුතු සහ අත්යන්ත්‍ර පේෂකර්මාන්තය වර්ධනය සඳහා අවශ්‍ය පර්යේෂණ, අත්හදා බැලීම් හා සංරක්ෂණ කටයුතු යනාදි කාර්යයන් සමාලෝචිත වර්ෂය තුළ සිදු කර නොතිබුණි.

## 2.6 කාර්යභාරයන් ඉටු කිරීම සඳහා පාර්ලිමේන්තුව විසින් සලසා තිබුණු ප්‍රතිපාදනය උපයෝජනය කිරීම

2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂ 05 ක කාලය තුළ දෙපාර්තමේන්තුවට සලසා තිබුණු ප්‍රතිපාදනය, උපයෝජනය හා ඉතිරිය පිළිබඳ තොරතුරු හා ඒ පිළිබඳ විගණන නිරීක්ෂණ පහත දැක්වේ.

| වර්ෂය | වියදම් වර්ගය | ශුද්ධ ප්‍රතිපාදනය | උපයෝජනය | ඉතිරිය | ඉතිරිය ශුද්ධ ප්‍රතිපාදනයේ ප්‍රතිශතයක් ලෙස |
|---|---|---|---|---|---|
| | | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | |
| 2013 | පුනරාවර්තන | 299.55 | 291.98 | 7.57 | 2.52 |
| | මූලධන | 26.10 | 21.65 | 4.45 | 17.05 |
| | **එකතුව** | **325.65** | **313.63** | **12.02** | **3.69** |
| 2014 | පුනරාවර්තන | 427.68 | 418.67 | 9.0 | 2.11 |
| | මූලධන | 33.70 | 30.99 | 2.71 | 8.04 |
| | **එකතුව** | **461.38** | **449.66** | **11.72** | **2.54** |
| 2015 | පුනරාවර්තන | 72.00 | 68.25 | 3.75 | 5.21 |
| | මූලධන | 31.50 | 18.28 | 13.22 | 41.96 |
| | **එකතුව** | **103.50** | **86.53** | **16.97** | **16.39** |
| 2016 | පුනරාවර්තන | 72.80 | 67.29 | 5.51 | 7.57 |
| | මූලධන | 33.15 | 33.02 | 0.13 | 0.39 |
| | **එකතුව** | **105.95** | **100.31** | **5.64** | **5.32** |
| 2017 | පුනරාවර්තන | 120.81 | 115.18 | 5.63 | 4.66 |
| | මූලධන | 36.45 | 24.51 | 11.94 | 32.76 |
| | **එකතුව** | **157.26** | **139.69** | **17.57** | **11.17** |

### (අ) විසර්ජන ගිණුම

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

#### (i) අධි ප්‍රතිපාදන සලසා තිබීම

වැය විෂයයන් 07 ක් සඳහා එකතුව රු.මිලියන 14.99 ක අධි ප්‍රතිපාදන සලසා තිබීම නිසා එම වැය විෂයයන්ට අදාල ප්‍රතිපාදනවලින් එකතුව රු.මිලියන 62.63 ක් පමණක් උපයෝජනය කිරීම නිසා ඉතිරිය සලසා තිබුණු ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 07 ක සිට සියයට 49 දක්වා පරාසයක ප්‍රමාණයක් වී තිබුණි.

#### (ii) වෙනත් අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු විසින් ලබා දුන් ප්‍රතිපාදන උපයෝජනය

වෙනත් අමාත්‍යාංශයක් හා දෙපාර්තමේන්තුවක් විසින් විවිධ කාර්යයන් සඳහා පිළිවෙලින් රු.මිලියන 50.00 ක් රු.මිලියන 97.62 ක් වශයෙන් එකතුව රු.මිලියන147.62 ක් ප්‍රතිපාදන ලබා දී තිබුණි. සමාලෝචිත වර්ෂය අවසන් වන විට

ඉන් එකතුව රු.මිලියන 39.81 ක් පමණක් උපයෝජනය කර තිබුණි. ඒ අනුව ලබා දී තිබූ ප්‍රතිපාදන වලින් රු.මිලියන 107.81 ක් හෙවත් සියයට 73 ක ප්‍රතිපාදන ඉතිරි වී තිබුණි.

**2.7 රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම**

**පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන්**

දෙපාර්තමේන්තුවට අදාල විෂය අංක 30301 යටතේ රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම වෙනුවෙන් පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන් හා තථ්‍ය අගයන් පහත දැක්වේ.

| **වියදම** | | **ලැබීම්** | | **හර ශේෂය** | |
|---|---|---|---|---|---|
| **උපරිම සීමාව** | **තථ්‍ය** | **අවම සීමාව** | **තථ්‍ය** | **උපරිම සීමාව** | **තථ්‍ය** |
| **රු.මිලියන** | **රු.මිලියන** | **රු.මිලියන** | **රු.මිලියන** | **රු.මිලියන** | **රු.මිලියන** |
| 5.50 | 5.15 | 3.20 | 3.64 | 30.00 | 14.27 |

මධ්‍යම පළාත් සභාවේ පේෂකර්මාන්ත දෙපාර්තමේන්තුවට ස්ථාන මාරු වී ගිය සේවකයකුගෙන් අයවිය යුතු රු.මිලියන 0.06 ක ණය ශේෂය සම්බන්ධයෙන් 2004 ඔක්තෝබර් 11 දිනැති හා අංක 118 දරන අයවැය චක්‍රලේඛයේ 3.2.1 හා 3.2.2 ඡේද ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

**2.8 අභ්‍යන්තර විගණනය**

2009 ජුනි 09 දිනැති අංක ඩීඑම්ජී/2009 (1) දරන කළමනාකරණ විගණන දෙපාර්තමේන්තු චක්‍රලේඛය ප්‍රකාරව දෙපාර්තමේන්තුවේ විගණන අංශයක් නොවූ අතර අමාත්‍යාංශය විසින් හෝ අභ්‍යන්තර විගණනයක් සිදුකර නොතිබුණි.

**2.9 තිරසාර සංවර්ධනය**

තිරසාර සංවර්ධනය පිළිබඳ එක්සත් ජාතීන්ගේ වසර 2030 ‘‘ න්‍යාය පත්‍රය ’’ ප්‍රකාරව සෑම රාජ්‍ය ආයතනයක් විසින්ම කටයුතු කළ යුතුව පවතින අතර සමාලෝචිත වර්ෂයට අදාලව දෙපාර්තමේන්තුව විසින් තම විෂය පථයට අනුව ළඟා කර ගත යුතු අරමුණු වශයෙන් තිරසාර සංවර්ධන අරමුණු 01 හා 09 හඳුනාගෙන තිබුණද, ඒවා ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් අභ්‍යන්තර චක්‍රලේඛ, මගපෙන්වීම් නිකුත් කර නොතිබුණි. තිරසාර සංවර්ධන අරමුණු ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් දෙපාර්තමේන්තුව කෙරෙහි උනන්දුවක් දක්වන පාර්ශවයන් දැනුවත් කිරීමත්, දැනට පවතින භෞතික සම්පත් කළමනාකරණය සඳහා ක්‍රමවේදයක් සැකසීමත්, අදාල කාර්යයන් නියාමනය සඳහා ක්‍රමවේදයක් හඳුනාගැනීමත් සිදුවී නොතිබුණි.

**2.10 මානව සම්පත් කළමනාකරණය**

**2.10.1 අනුයුක්ත කාර්ය මණ්ඩලය, තථ්‍ය කාර්ය මණ්ඩලය හා පුද්ගල පඩිනඩි සඳහා වියදම**

දෙපාර්තමේන්තුවේ කාර්යභාරය ඉටු කිරීම සඳහා 2017 දෙසැම්බර් 31 දිනට අනුමත, තථ්‍ය, පුරප්පාඩු හා අතිරික්ත කාර්ය මණ්ඩලය පිළිබඳ විස්තර පහත දැක්වේ. සමාලෝචිත වර්ෂය වෙනුවෙන් දෙපාර්තමේන්තුව විසින් පුද්ගල පඩිනඩි වැය කාණ්ඩය වෙනුවෙන් රු.මිලියන 57.51 ක් වැය කර තිබුණි.

| සේවක වර්ගය | අනුමත සේවක සංඛ්‍යාව | තථ්‍ය සේවක සංඛ්‍යාව | 2017 දෙසැම්බර් 31 දිනට පුරප්පාඩු සංඛ්‍යාව |
|---|---|---|---|
| ජ්‍යෙෂ්ඨ මට්ටම | 05 | 03 | 02 |
| තෘතීය මට්ටම | 01 | - | 01 |
| ද්විතීය මට්ටම | 109 | 82 | 27 |
| ප්‍රාථමික මට්ටම | 42 | 34 | 08 |
| | **157** | **119** | **38** |

මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කෙරේ.

(අ) දෙපාර්තමේන්තුවේ නියෝජ්‍ය /සහකාර අධ්‍යක්ෂ (සංවර්ධන) තනතුර 2011 වර්ෂයේ සිටද, පරිපාලන නිලධාරී තනතුර 2008 වර්ෂයේ සිටද පුරප්පාඩුව පැවතුණි.

(ආ) පුහුණුකිරීම් සඳහා පසුගිය වර්ෂ 05 ක් තුල සලසා තිබුණු ප්‍රතිපාදනයේ උපයෝජනය 2013 වර්ෂයේදී සියයට 93 ක්ව පැවති අතර සමාලෝචිත වර්ෂය වන විට එය සියයට 73 ක් වී තිබුණි.

(ඇ) වාර්ෂික ස්ථානමාරුවීම්වලට යටත් නිලධාරීන් 10 දෙනෙකු වර්ෂ 06 සිට වර්ෂ 14 දක්වා කාලයක් ස්ථාන මාරුවීම් නොලබා සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් දෙපාර්තමේන්තුවේ සේවය කරමින් පැවතුණි.